සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ...

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: ඉතිහාසය I History I | කාලය Time: පැය 01යි 01 hour |

නම : - ........................................................ ශ්‍රේණිය :- ........................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දීපවංසය හා මහාවංසය වැනි කෘති රචනා කර ඇති භාෂාව කුමක් ද?
(1) සංස්කෘත (2) පාලි (3) සිංහල (4) ප්‍රාකෘත

02. කෝට්ටේ රාජ්‍ය සමයේ සිට මහනුවර රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන මූලාශ්‍රයන් වන්නේ,
(1) මයුර, තිසර හා සැළලිහිණි යන සංදේශ කාව්‍ය
(2) බෝධිවංසය, ථූපවංසය හා ධාතුවංසය
(3) සංදේශ කාව්‍ය, සටන් කාව්‍ය හා ප්‍රශස්ති කාව්‍යය
(4) අභිලේඛන, කාසි හා නටබුන්

03. මෙරටට නොපැමිණ මෙරට පිළිබඳ තොරතුරු රචනා කළ විදේශීය කතුවරුන් පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
(1) පාහියන් හිමි, ටොලමි, ඉබන් බතුතා (2) රොබට් නොක්ස්, ඉබන් බතුතා, බැල්දියස්
(3) ඇරිස්ටෝටල්, ටොලමි, මෙගස්තනීස් (4) රොබට් නොක්ස්, ඉබන් බතුතා, ප්ලිනි

04. පහත A හා B තීරු නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| 1. පුවරු ලිපි | (A) ගල්වල කාටාරම් අසල ලියූ ලිපි |
| 2. ටැම් ලිපි | (B) ගල් කුළු මත ලියූ ලිපි |
| 3. ලෙන් ලිපි | (C) ගල් කුළුණු මත ලියූ ලිපි |
| 4. ගිරි ලිපි | (D) ඔපමට්ටම් කරන ලද ගල්වල ලියූ ලිපි |

(1) D C A B (2) D C B A (3) B C D A (4) A B C D

05. මෙරටින් විදේශීය කාසි හමුවීමෙන් පැහැදිලි වන්නේ,
(1) විදේශීය රටවල පැවති ආර්ථිකයයි.
(2) විදේශීය රටවල කාසි භාවිත වූ බවයි.
(3) විදේශීය රටවල් ශ්‍රී ලංකාව සමග වෙළඳ කටයුතු සිදුකළ බවයි.
(4) විදේශීය රටවල විවිධ ලෝහ වර්ග භාවිත වූ බවයි.

06. ඉර, හඳ, සත්ත්ව රූප, දුන්න, ඊතලය වැනි සංකේත ලංකාවේ විවිධ ප්‍රදේශවල ගල්වල කොටා තිබීමෙන් පැහැදිලි වන්නේ,
(1) නිධන් තැන්පත් කර ඇති ස්ථානයන් ය. (2) වටිනා පුරාවස්තු තැන්පත් කළ ස්ථානයන් ය.
(3) අතීතයේ සතුන් බහුලව සිටි ප්‍රදේශයන් ය. (4) අතීතයේ පැවැති ප්‍රාදේශීය මායිම් ය.

07. ශ්‍රී ලංකාව ජනාවාස කරන ලද මුල්ම මානවයා හැඳින්වූ නම කුමක් ද?
(1) හෝමෝ ඉරෙක්ටස් (2) හෝමෝ සාපියන්
(3) හෝමෝ හැබිලිස් (4) හෝමෝ නියැන්ඩතාලෙන්සිස්

08. පහත සඳහන් A හා B තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | A | | B |
|---|---|---|---|
| 1. | පහතරට තෙත් කලාපීය ලෙන් | (A) | පොතාන, අලිගල |
| 2. | මුහුදුබඩ කලපු හා විල්ලු | (B) | පාහියන්ගල ලෙන, බෙලිලෙන |
| 3. | කඳුකර තණ බිම් | (C) | බූන්දල, පතිරාජවෙල |
| 4. | පහතරට වියළි කලාපීය ලෙන් | (D) | බණ්ඩාරවෙල, හෝර්ටන් තැන්න |

(1) B C A D (2) A B D C (3) C A D B (4) B C D A

09. ප්‍රාග් ඓතිහාසික මානවයා පිළිබඳ පැරණිම තොරතුරු හමුවන ලෙන කුමක් ද?
(1) කුරුවිට බටදොඹලෙන (2) බුලත්සිංහල පාහියන්ගල ලෙන
(3) අත්තනගොඩ අළු ලෙන (4) කිතුල්ගල බෙලි ලෙන

10. පූර්ව ඓතිහාසික යුගයට අයත් ශිලා මංජුසා සුසාන හමු වූ ස්ථාන දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඉබ්බන්කටුව, රංචාමඩම, බෙරගල
(2) ඉබ්බන්කටුව, යටිගල්පොත්ත, ගල් සොහොන් කනත්ත
(3) බෙරගල හල්දුම්මුල්ල, රංචාමඩම
(4) ගල්සොහොන් කනත්ත, බෙරගල, ඉබ්බන්කටුව

11. හෝලෝසීන යුගය ලෙස සැලකෙන්නේ,
(1) ගල් ආයුධ නිපදවීම ආරම්භ වූ යුගයයි.
(2) මහා හිම යුගය ආරම්භ වූ අවධියයි.
(3) අයිස් යුගය අවසන් වී ලෝකය උණුසුම් වීමට පටන් ගත් අවධියයි.
(4) මානව පරිණාමයේ ආරම්භය සිදුවූ අවධියයි.

12. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ආරම්භ වු දේශගුණික කලාපය කුමක් ද?
(1) තෙත් කලාපය (2) වියළි කලාපය (3) අර්ධ ශුෂ්ක කලාපය (4) ශුෂ්ක කලාපය

13. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ගංගාවල පිටාර තැන්නට පිටතින් බිහිවීමට හේතුව කුමක් ද?
(1) ගොවිතැනට අවශ්‍ය ජලය වැව්වලින් ලබා ගැනීමට හැකිවීමයි.
(2) ගංගාවට පිටතින් සාරවත් පසක් පිහිටා තිබීමයි.
(3) පහසුවෙන් සතුන් දඩයම් කර ගැනීමට හැකිවීමයි.
(4) ගංවතුර පාලනය කිරීමට තාක්ෂණයක් නොදන සිටීමයි.

14. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට කැණීම් කරන ලද ප්‍රදේශ වන්නේ,
(1) අනුරාධපුරයේ ඇතුළු නුවරයි. (2) රත්නපුරයේ රංචාමඩමයි.
(3) තිස්සහාරාමයේ මාගමයි. (4) හම්බන්තොට වැල්ලෙගංගොඩයි.

15. පෙරදිග රටවල වැඩි දෙනෙකුගේ එකඟතාවයෙන් රට පාලනය කිරීමට පත්වන තැනැත්තා හැඳින්වූයේ කුමන නමකින් ද?
(1) සේනාසම්මත (2) මහා සම්මත (3) අග රජ (4) චක්‍රවර්තී

16. පරුමකවරුන්ට පැවරී තිබූ මූලික කාර්යයක් දක්වෙන පිළිතුර කුමක් ද?
(1) රජතුමාට උපදෙස් දීම
(2) ගම්වැසියන්ගේ සුබසාධනය සැලසීම
(3) ප්‍රාදේශීය පාලකයන් අතර සුහදතාවය ඇතිකර ගැනීම
(4) වැව් පද්ධතියක් බාරව කටයුතු කිරීම

17. ගමික විසින් ඉටු කළ යුතු කාර්යයන් නොවන්නේ මින් කුමක් ද?
(1) ගමට අයත් වැව් නඩත්තු කිරීම (2) වැවෙන් ජලය බෙදාහැරීම
(3) වැව් පද්ධතියකට නායකත්වය දීම (4) ගම්වල පැවැති ආරවුල් විසඳීම

18. පාණ්ඩ්‍ය වංශිකයන්ගේ ආධාරයෙන් පොළොන්නරුවේ තෙවරක් බලයට පත් වූ රැජිනිය වන්නේ,
(1) සුගලා දේවියයි. (2) ලීලාවතී රැජිණයි.
(3) චූල සීවලී රැජිණයි. (4) කල්‍යාණවතී රැජිණයි.

- **පහත සඳහන් ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 19 හා 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. ශ්‍රී මහා බෝධිය මෙරටට වැඩම කරවීම.
B. ලම්භකරණ රජ පෙළපතේ ආරම්භක පාලකයා වීම.
C. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
D. ප්‍රාදේශීය පාලකයන් අවනත කර ගැනීම.
E. පළමුවරට විශාල වැව් ඉදිකිරීම.

19. දේවානම්පියතිස්ස රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A D (2) B D (3) B C (4) A C

20. වසභ රාජ්‍ය සමයට අයත් සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) D C (2) C E (3) A C (4) B E

21. අතීතයේ දී දිගු දුරක් මැනීමට භාවිත කළ මිනුම් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) ගව්ව, උසබ (2) වියත, ආංගුලය
(3) ආංගුලය, යොදුන (4) වියත, ගව්ව

22. ක්‍රිස්තු වර්ෂ නම වන සියවසට අයත් සෙල්ලිපියක එක්තැන්සමිය යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(1) විධායකය හා අධිකරණයයි. (2) විධායකයයි.
(3) ව්‍යවස්ථාදායකයයි. (4) ව්‍යවස්ථාදායකය හා විධායකයයි.

23. වසභ රජුගේ පාලන සමයේ නාගදීපය මුල්කරගෙන උතුරු පළාත පාලනය කළේ කවුරුන් විසින් ද?
(1) සින්නාරුඹිම් බුදල්නා විසිනි. (2) මහලේ කස්බා විසිනි.
(3) ඍෂිගිරි ඇමතියා විසිනි. (4) දසගම් ඇත්තන් විසිනි.

24. පළමු වන විජයබාහු රජතුමා පොළොන්නරුවේ දළදා මාලිගය ආරක්ෂා කිරීමට දකුණු ඉන්දියාවෙන් ගෙන්වාගත් ආරක්ෂක හමුදාව
(1) අගම්පඩි හමුදාවයි. (2) වේලයික්කාර හමුදාවයි.
(3) කාලිංග හමුදාවයි. (4) පාණ්ඩ්‍ය හමුදාවයි.

25. A තීරුවෙන් සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් ද සාහිත්‍ය මූලාශ්‍රයවල හේන් වගාව හැඳින්වූ නම් කීපයක් B තීරුවේ ද සඳහන් වේ. A හා B තීරු ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1. | බුත්සරණ | (A) | පිටි බිම් |
| 2. | උම්මග්ග ජාතකය | (B) | සෙහෙන් |
| 3. | සෙල්ලිපි | (C) | නවදැලි හේන |
| 4. | සද්ධර්මරත්නාවලිය | (D) | සේන් |

(1) B C D A (2) B D C A (3) B D A C (4) A B C D

26. අතීතයේ දී වී වගා කළ කන්න තුනක් පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය කුමක් ද?
(1) හෝපිටිගමුව සෙල්ලිපිය (2) මණ්ඩගල සෙල්ලිපිය
(3) තෝනිගල සෙල්ලිපිය (4) වේගිරිය සෙල්ලිපිය

27. දකුණු ඉන්දියානු කුලී හේවායන්ගේ සහාය ලබාගත් මෙරට රාජ්‍ය පාලකයන් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ඉලනාග රජු හා භාතිකාභය රජු (2) මහා පරාක්‍රමබාහු රජු හා මහා විජයබාහු රජු
(3) පළවෙනි සේන රජු හා වසභ රජු (4) ඉලනාග රජු හා අභයනාග රජු

28. බලයක් යොදා ගල්පතුරු ගලවාගෙන මෙවලම් තැනීමේ තාක්ෂණය හඳුන්වන්නේ,
(1) ගුරුත්වාකර්ෂණය ලෙසිනි. (2) පීඩන ශල්කණය ලෙසිනි.
(3) ආදේශනය ලෙසිනි. (4) ආකර්ෂණය ලෙසිනි.

29. කාල රක්ත මැටි බඳුන් යනුවෙන් හැඳින්වූයේ,
(1) පූර්ව ඓතිහාසික යුගයේ තැනූ මැටි බඳුන් ය.
(2) පිටත රතු පැහැයෙන් හා ඇතුළත කළු පැහැයෙන් යුත් මැටි බඳුන් ය.
(3) කාලයකට අනුව නිවැරදිව පුළුස්සා ගත් මැටි බඳුන් ය.
(4) මතුපිට ඔප දමා රතු වර්ණ ගැන්වූ මැටි බඳුන් ය.

30. • අඹන් ගඟ හරස්කර ඉදි කර ඇත.
- මින්නේරිය ගිරිතලේ හා කන්තලේ යන වැව්වල ජලය ලබාගෙන ඇත.
- වසභ රජු විසින් ඉදිකර ඇත.
- පුරාණයේ ඉදි කළ දුවැන්තම ඇළ මාර්ගයකි.

ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ ඇළ මාර්ගය වනුයේ,
(1) ඇළහැර ඇළ යි. (2) යෝධ ඇළ යි.
(3) අංගමැඩිල්ල ඇළ යි. (4) මිණිපේ ඇළ යි.

31. යකඩ උදුන් හමු වූ ස්ථාන දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) සිගිරියේ අල කොළ වැව, රත්නපුරයේ ගල්පාය
(2) බලන්ගොඩ සමනල වැව, සීගිරියේ දෙහි ගහ ඇලකන්ද
(3) බෙරගල සුසානය, සිගිරියේ දෙහිගහ ඇළකන්ද
(4) සීගිරියේ අල කොළ වැව, දකුණු පළාතේ වැලිගත්ත

32. ලිමෝනයිට් සහ හෙමටයිට් යනුවෙන් හඳුන්වන්නේ,
(1) ආභරණ තැනීමට ඉන්දියාවෙන් ගෙන ආ පබළු වර්ග දෙකකි.
(2) කිරුම් මිනුම් සඳහා භාවිත කළ ඒකක දෙකකි.
(3) විදේශීය වෙළඳාමේ භාවිත කළ මැණික් වර්ග දෙකකි.
(4) යකඩ නිස්සාරණය කිරීමට භාවිත කළ ගල් වර්ග දෙකකි.

33. අභයගිරි කැණීම්වලින් සොයාගත් මැටි කර්මාන්තයේ දියුණුව මැනවින් පෙන්නුම් කරන සාධකය කුමක් ද?
(1) මැටි මුද්‍රා හමු වී තිබීම (2) මැටි කවච හමුවී තිබීම
(3) වර්ණාලේපිත උළු හමු වී තිබීම (4) වර්ණාලේපිත මැටි බඳුන් හමු වී තිබීම

34. අතීතයේ දී කිරිමඩු ශාන්ති කර්මය පැවැත්වූයේ
(1) දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා ය. (2) ගවයන් ආරක්ෂා කර ගැනීම සඳහා ය.
(3) වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ය. (4) ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහා ය.

35. A හා B තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | | B | |
|---|---|---|---|
| 1. | රද්කොල් සම්දරු | (A) | සාමාන්‍ය ජනතාව |
| 2. | කුඩීන් | (B) | කුලියට ගත්ත දාසයන් |
| 3. | අන්වයාතදාස | (C) | රාජකීය නිලධාරීන් |
| 4. | ධනක්කීතදාස | (D) | පාරම්පරික දාසයන් |

(1) B C D A (2) C A D B (3) B A C D (4) D A B C

36. පැරණි සමාජයේ අපරාධකරුවෙකු ගමක සැඟ වී සිටින අවස්ථාවක ඔහු අල්ලා දීමේ වගකීම පැවරී තිබුණේ,
(1) ගම්කට ය. (2) පරුමකට ය.
(3) දසගම් ඇත්තන්ට ය. (4) ගමේ සියලු දෙනාටම ය.

37. මෙරටින් බහුලව හමු වී ඇති විදේශීය කාසි වර්ගය කුමක් ද?
(1) රෝම කාසි (2) චීන කාසි (3) ඉන්දියානු කාසි (4) අරාබි කාසි

38. සිතුල්පව්ව සෙල්ලිපියට අනුව මහා විනිශ්චශාලාවෙන් ලැබෙන දඩ මුදල් වැය කළේ කුමක් සඳහා ද?
(1) විහාරයේ සංවර්ධන කටයුතු සඳහා ය. (2) දිළිඳු වැසියන්ගේ සුබ සාධනය සඳහා ය.
(3) භික්ෂූන්ට අවශ්‍ය දානය සපයා ගැනීමට ය. (4) භික්ෂූන්ගේ සිව්පසය සපයා ගැනීමට ය.

39. දම්පියා අටුවා ගැටපදයේ මධුපාචිකා යන විශේෂ ගෞරව නාමයෙන් හැඳින්වූයේ
(1) සූපශාස්ත්‍රයෙහි නිපුණ කාන්තාවන් ය. (2) රූපලාවන්‍ය කටයුතුවල නිපුණ කාන්තාවන් ය.
(3) දෙමාපියන්ට කීකරුව සිටි කාන්තාවන් ය. (4) සමාජයේ ගෞරවාදරයට ලක් වූ කාන්තාවන් ය.

40. පරිසරයේ තිබෙන ජීවමාන බව පෙන්වන දහනම වන සියවසට අයත් චිත්‍රයක් දැකිය හැකි ස්ථානය කුමක් ද?
(1) සිතුල්පව්ව (2) කැලණි විහාරය
(3) මුල්කිරිගල විහාරය (4) සීගිරිය